# නිවිතිගල ප්‍රාදේශීය සභාව

## භාණ්ඩ,වැඩ හා සේවා සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2025

මෙහි පහත උප ලේඛනයේ සඳහන් භාණ්ඩ,වැඩ හා සේවාවන් සැපයීම් හා කොන්ත්‍රාත්කරුවන් ලෙස 2025 වර්ෂයේ ලියාපදිංචි වීමට කැමති ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ.

සියලුම අයදුම්පත්,**නම, ලිපිනය, ජා.හැ.අංකය, ව්‍යාපාර ලියාපදිංචි අංකය, දුරකථන අංකය, විද්‍යුත් ලිපිනය, සපයනු ලබන භාණ්ඩ වර්ගය** ඇතුළත් වන පරිදි තමා විසින්ම සකස්කර ගත් අයදුම්පතක් හා ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් සමඟ ලියාපදිංචි ගාස්තු ද සමඟ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුයි. අයදුම් පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම -2025 "** ලෙස සටහන් කළ යුතුය.

දැනට භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වී ඇති අය අලුත් කිරීමට ඉල්ලුම් කළ යුතු අතර, ලියාපදිංචි සීමාව වැඩිකර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා ද අයදුම් කළ යුතුය.

## සේවා සැපයුම්කරුවන් සඳහා කොන්දේසි

01.සැපයුම්කරුවන් සඳහා අදාළ වර්ෂයට ව්‍යාපාර ලියාපදිංචි සහතිකය තිබිය යුතුය.

02.ආයතනය මගින් සපයනු ලබන භාණ්ඩ හා සේවාව පිළිබඳව විස්තරයක් ඇමිණිය යුතුය.

03.කලින් සැපයුම් කළ ආයතන වල විස්තරයක් ඇමිණිය යුතුය.

## කොන්ත්‍රාත්කරුවන් සඳහා කොන්දේසි

01.ඉක්ටැඩ්,පළාත් සභා ,ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ලියාපදිංචි වී ඇත්නම් එම සහතිකය හෝ එසේ නොමැති නම් වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

02. ප්‍රමාණවත් උපකරණ තමන් සතුව පවතින බව,සේවා කාර්යයෙහි නිරත වීමට තරම් ප්‍රමාණවත් ප්‍රවීණ කාර්ය මණ්ඩලයක් ආයතනය තුළ සිටින බව සහතික කිරීමේ යෝග්‍යතා සහතිකයක් හෝ සනාථ කිරීමේ සහතිකයක් ලබාදිය යුතුය.

03.ඉදිකිරීම් ප්‍රවීනතා පිළිබඳ විස්තර ( ගොඩනැගිලි ඉදිකිරීම්, මාර්ග සංවර්ධනය ආදී) ඉදිරිපත් කළ යුතුය.

චෙක්පත් හා මුදල් ඇණවුම් **"ලේකම්,නිවිතිගල ප්‍රාදේශීය සභාව,නිවිතිගල "** යනුවෙන් ලියා එවිය යුතුය.

ලියාපදිංචි වීම සඳහා වූ අයදුම්පත් භාරගන්නා **අවසන් දිනය 2024.12.31** වේ.**ඉන් පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.**

| අනු අංකය | සැපයුම් ද්‍රව්‍ය 01 | ලියාපදිංචි ගාස්තු රු. | ශත |
|---|---|---|---|
| 01 | කාර්යාලීය උපකරණ හා ලිපිද්‍රව්‍ය | 750 | 00 |
| 02 | ලී බඩු | 750 | 00 |
| 03 | වානේ ගෘහ භාණ්ඩ හා කාර්යාල භාණ්ඩ | 750 | 00 |
| 04 | විදුලි උපකරණ හා වීදි ලාම්පු, බල්බ | 750 | 00 |
| 05 | සෞඛ්‍ය උපකරණ ( කසළ කරත්ත, කසළ බාල්දි, කොහු, ඉදල් ,බුරුසු, ග්ලවුස්, බූට්ස්, වැහිකබා ) | 750 | 00 |
| 06 | කොන්ක්‍රීට් භාණ්ඩ ( හියුම් පයිප්ප ආදිය ) | 750 | 00 |
| 07 | නිළ ඇඳුම් ,තිර රෙදි, මේස රෙදි | 750 | 00 |
| 08 | හාඩ්වෙයාර් අයිතමයන් ( සිමෙන්ති,යකඩ,හුණුකැට,කම්බි,ඉදිකිරීම් ද්‍රව්‍ය යනාදිය ) | 750 | 00 |
| 09 | ක්‍රීඩා භාණ්ඩ ,ක්‍රීඩා උපකරණ | 750 | 00 |
| 10 | පොල් ලී, උණ ලී,ඇතුළු දැව වර්ග, සැටරින් ලෑලි | 750 | 00 |
| 11 | ගංගා වැලි ,කොන්ක්‍රීට් ගල් | 750 | 00 |
| 12 | ගඩොල් ,බ්ලොක්ගල් ආදිය | 750 | 00 |
| 13 | කළු ගල් | 750 | 00 |
| 14 | පී.වී.සී.උපකරණ ඇතුළු උපාංග | 750 | 00 |
| 15 | සියලුම වාහන අමතර කොටස් (ටයර්,ටියුබ්.බැටරි) | 750 | 00 |
| 16 | බයිසිකල් ඇතුළු බලපත්‍ර නිකුත් කිරීමේ තහඩු වර්ග | 750 | 00 |
| 17 | තාර වර්ග ලබා ගැනීම | 750 | 00 |
| 18 | කාර්යාලීය දිනපොත් /පුස්තකාල පොත් | 750 | 00 |
| 19 | පරිගණක උපාංග (ප්‍රින්ටර්ස්,හා ෆොටෝ කොපි යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර්,කාට්රිජ් ) | 750 | 00 |
| | **සේවා සැපයුම් 02** | | |
| 01 | වාහන අලුත්වැඩියාව | 750 | 00 |
| 02 | කුලී පදනම මත ට්‍රැක්ටර් ,කැටපිලර් හා මාර්ග තලනය ආදී යන්ත්‍ර සැපයීම | 750. | 00 |
| 03 | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම | 750 | 00 |
| 04 | බැනර් ,නාම පුවරු සකස් කිරීම | 750 | 00 |
| 05 | යතුරු ලියනය,රෝනියෝ යන්ත්‍ර,ෆැක්ස් යන්ත්‍ර ,ඡායා පිටපත් ,වායු සමීකරණ යන්ත්‍ර,පරිගණක යන්ත්‍ර අලුත්වැඩියාව | 750 | 00 |
| 06 | භාණ්ඩ ප්‍රවාහනය සඳහා කුලී පදනම මත වාහන ලබා ගැනීම | 750 | 00 |
| 07 | මුද්‍රණ කටයුතු | 750 | 00 |
| 08 | ගස් කැපීම සඳහා සේවය ලබා ගැනීම | 750 | 00 |
| 09 | වීථි පහන්,සවි කිරීම සඳහා විදුලි කාර්මික සේවය ලබා ගැනීම | 750 | 00 |
| 10 | වාහන සේවා කිරීම | 750 | 00 |
| | **ඉදිකිරීම් කැනීම් වැඩ 03** | | |
| 01 | රු.500,000.00 දක්වා | 2000 | 00 |
| 02 | රු.500,000.00 සිට රු.1000,000.00 දක්වා ලියාපදිංචි ගාස්තු | 3000 | 00 |
| 03 | රු.1000,000.00 සිට රු.2000,000.00 දක්වා ලියාපදිංචි ගාස්තු | 5000 | 00 |
| 04 | ලියාපදිංචි අලුත් කිරීමට | 1500 | 00 |

**වැඩි විස්තර රාජකාරි වේලාවන් තුළ දී දුරකථන අංක 045-2279275 න් විමසා දැනගත හැකිය.**

2024.10.23 වන දින
නිවිතිගල ප්‍රාදේශීය සභාවේදීය

ඩී.ඩී. ආර් .අබේගුණවර්ධන,
ලේකම්,
නිවිතිගල ප්‍රාදේශීය සභාව,
නිවිතිගල.